www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රයිස් ලෙබනනය තුල ලේවැකි පියසටහන් තබා යයි

**Rice leaves bloody footprints in Lebanon**

**කර්තෘ මන්ඩලය විසිනි**

**2006 ජුලි 26**

21 වැනි සියවසේ මුල් දශකය තුල, රාජ්‍යාන්තර නායකත්වය සඳහා ඇමරිකාවේ අවාසනාවන්ත කඩා පැනීම, විවේචනාත්මක අධ්‍යයනයක මාර්තෘකාව වන අවස්ථාවක ජනාධිපති බුෂ් යටතේ ඇමරිකානු රාජ්‍ය ලේකම් ලෙස කොන්ඩලීසා රයිස් හා හිට්ලර් චාන්සලර්වරයා යටතේ ජර්මන් විදේශ ඇමති ලෙස ජෝකිම් රිබන්ට්‍රොප්ගේ නිල කාලය අතර විරූපී සමාන්තරයක් ඉතිහාසඥයන් විසින් සොයා ගනු ඇත. ලෝක යුද්ධයට වේදිකාව සැකසූ තුන්වන රයිකයේ විදේශ පිලිවෙතෙහි සියලු අංගලක්ෂන, එනම් එහි තුච්ඡ ප්‍රෝඩාකාරීත්වය, නරුමත්වය, කුහකත්වය, නොතැකීම, මනුෂ්‍ය ජීවිතය කෙරෙහි පරම සතුරුකම හා භීෂනය කෙරෙහි ලොල්කම, රයිස්, ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති ප්‍රකාශිකාව ලෙස සේවය කරන බුෂ් පරිපාලනයේ ක්‍රියාන්විතයන් තුල, 70 වසරකට පසුව ද, නිරීක්ෂනය කල හැකි ය.

රාජ්‍ය ලේකම් රයිස් ඊස්රායලයට යෑමට ප්‍රථම යුද්ධයෙන් ඉරීගිය ලෙබනනයට, පය තැබීමෙන් පසු ගත වූ පැය 48 තුල, මෙම සියලු ගුනාංගයන් ඉහලින් ම විදහා දැක්වුනි. බේරූට්හි දී ඇයට දැක බලාගත හැකි වූයේ, ඇය විසින් ම පන ගන්වනු ලැබූ ප්‍රතිපත්තීන්ගේ ප්‍රතිඵලය යි. එහෙත් කුහකකමේ හා කනගාටුව පල කරන සංකේතාත්මක අංග චලනයන් හැරෙන්නට, විශේෂයෙන් කරදරයට පත් වූ බවට කිසිදු ඇඟවීමක් ඇය පල නොකලා ය. තිබුනේ එහි අනෙක් පැත්ත ය. ඊස්රායල් යුද යාන්ත්‍රනයේ ක්‍රියාවන්ගෙන් දැඩි ලෙස හානියට පත්ව තිබෙන්නා වූ ද, ලක්ෂ ගනන් මිනිසුන්, ගැහැනුන් හා ළමයින්ට නිවාස අහිමිව, අවශ්‍ය තරම් ආහාර හා ජලය නොමැති කමින් පීඩා විඳින රටක, දුවැන්ත බෝම්බ ප්‍රහාරයන්ට ගොදුරු වී ඇති නගරයක් මධ්‍යයේ දී, පැහැදිලි උඩඟුකමකින් යුක්තව රයිස් ප්‍රකාශ කලේ නව මැදපෙරදිගක් බිහි වී ඇති බවයි.

එක්සත් ජනපදය මේ අවස්ථාවේ සටන් විරාමයකට සහය නොදක්වන බව රයිස් අවධාරනය කරන විට, එය අසා සිටි ඇගේ ලෙබනන් සංවාදශීලීන් කුමක් සිතුවේ ද යන්න යමෙකුට සිහියට නගාගැනීමට වත් නොපුලුවන. ප්‍රථමයෙන්, "කල් පවතින සාමයකට" කොන්දේසි නිර්මානය කල යුතු ය. මෙහි පෙරලූ අර්ථය: එක්සත් ජනපදයේ හා ඊස්රායලයේ අර්ධ වැයික්කියක් බවට එරට පත් කිරීමට ඇති සියලු අභ්‍යන්තර විරෝධයන් අවසන් වන තෙක් ද, සිරියානු ආන්ඩුව පෙරලා දමන හා ඉරානයට එරෙහි අනාගත යුද්ධයේ මෙහෙයුම් සඳහා උපස්තම්භක වන පදනම සම්පූර්නවන තෙක් ද, ලෙබනනයටත් එහි ජනතාවටත් ම්ලේච්ඡ ප්‍රහාර එල්ල කරමින් තව දුරටත් විනාශය කර ගෙන යාමට ඊස්රායලයට තව කල් ලබා දිය යුතු ය.

ඊස්රායලයට ගිය රයිස්, ඕල්මර්ට් ආන්ඩුවට දුන් මුඛ්‍ය පනිවිඩය වූයේ; එය කරගෙන යන්න. එක්සත් ජනපදයේ නොසැලෙන සහයෝගයෙන් දිරිමත් වූ ඊස්රායල් මිලිටරිය, එක්සත් ජාතීන්ගේ නිරීක්ෂන මැදිරියක් කුඩු කර දැමූ ප්‍රහාරය එල්ල කිරීමට නිර්භය විය.

1982 සිට 2000 දක්වා ඊස්රායලය යටත් කරගෙන සිටි ප්‍රදේශයේ පූර්න පරිමාන ප්‍රති ආක්‍රමනයක් සංඥා කරමින්, ඊස්රායල් මිලිටරිය දකුනු ලෙබනනයේ නම් නොකල "ආරක්ෂක කලාපයක්" පිහිටුවන බව, රයිස් කලාපයෙන් නික්ම ගිය වහාම, ආරක්ෂක ඇමති අමීර් පෙරෙට්ස් නිවේදනය කලේ ය. ඊස්රායල් ආන්ඩුවේ අංශවල ඇස්තමේන්තුව වූයේ එම කලාපය කි.මී. 10ක් දක්වා පුලුල් වන බවයි. එහෙත් ඊස්රායලයේ උතුරු කලාපයෙහි හමුදා ආඥාපතියෙක් වන ජෙනරාල් ඇලෝන් ෆ්‍රීඩ්මාන් මීට පෙර කියා ඇත්තේ ලෙබනනය තුලට කි.මී. 70ක් විනිවිද යන බවයි.

පෙරෙට්ස්ගේ ප්‍රකාශයෙන් සුලු වේලාවකට පසුව, දකුනු ලෙබනනයේ නිරීක්ෂන මැදිරියක සිටි එක්සත් ජාතීන්ගේ සාම සාධක නිලධාරීන්, ඊස්රායල් ගුවන් ප්‍රහාරයකින් මරුමුවට පත් විය. ලෙබනනයෙහි එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් ප්‍රකාශ කලේ, චීනය, ඔස්ට්‍රියාව, කැනඩාව හා ෆින්ලන්තයේ සිව් දෙනෙක්, මීට පෙර මැදිරියට 14 වතාවක් ඊස්රායල කාලතුවක්කු ප්‍රහාර එල්ල වීමෙන් පසුව මැදිරිය යට බංකරයක රැකවරන ලැබූ බවයි. සුන් බුන් ඉවත් කිරීමට උත්සාහ කල සහන සේවක කන්ඩායමකට ද ෂෙල් වෙඩි එල්ල විය.

"පෙනී යන පරිදි හිතාමතා ම මැදිරිය ඉලක්ක කිරීම" පිලිබඳව තමා "ගැඹුරින්ම කම්පාවටත් විමතියටත්" පත් වූ බව එ.ජා. මහා ලේකම් කොෆී අනන් ප්‍රකාශ කලේ

ය. එ.ජා. මැදිරිය පැහැදිලිව සලකුනු කර තිබූ අතර එහි සම්බන්ධීකරනය ඊස්රායල් මිලිටරිය සමග සටහන් කරනු ලබයි. 2000කින් සමන්විත එ.ජා. දූත මෙහෙවර වසර 1978 පටන් දේශ සීමා ප්‍රදේශයන්හි කටයුතු කරයි.

එ.ජා. මැදිරිය විනාශ කිරීමේ එකම සිතාගත හැකි හේතුව, ඊස්රායල් ප්‍රහාරය නිරීක්ෂනය කිරීම වැලැක්වීම ය. නිල් රේඛාව ලෙස හඳුන්වන ඊස්රායල්-ලෙබනන් දේශ සීමාව දිගේ සිටින එ.ජා. නිරීක්ෂකයන්, ප්‍රධාන ප්‍රචන්ඩකාරී සිදු වීම් මෙන් ම තනි තනි සිද්ධීන් ද සමීපව නිරීක්ෂනය කරන අතර මාධ්‍ය වෙත දිනපතා වාර්තා සපයයි.

තවත් උතුරට සිදු වන පහර දීම් පිලිබඳ තොරතුරු ඇතුලත් නොවුන ද, එ.ජා. දකුනු ලෙබනනයේ ප්‍රහාරයන්හි තීව්‍රභාවය විදහා දක්වන දුර්ලභ ඡායාරූවක් ගෙන හැර දක්වයි. නිදසුනක් ලෙස ජූලි 24 දින පමනක් නිල් රේඛාව ආසන්නයේ හෙස්බුල්ලාවරුන් මිසයිල් ප්‍රහාර 12ක් එල්ල කල අතර ඊස්රායලය ගුවන් හා කාලතුවක්කු ප්‍රහාර 45ක් එල්ල කර ඇත. මීට අමතරව, දින හයක දරුනු ගැටුම්වලින් පසුව ඊස්රායලය විසින් අල්ලා ගත් බිමට සමතලා කෙරුනු බින්ට් ජබේල් නගරය වටා විවිධ ගැටුම් සිදු විය.

පසු ගිය දින කිහිපය තුල දැඩි බෝම්බ හෙලීම්වලට ලක් වූ, බින්ට් ජබේල් නගරයට කි.මී.10ක් උතුරෙන් පිහිටි, නබටියාහි නිවාස දෙකක් ඊස්රායල ගුවන් ප්‍රහාරවලින් විනාශ වූයේ, එ.ජා. මැදිරිය බිඳ හෙලීමෙන් පසුව ය. එක් නිවසක දෙමාපියන් හා ඔවුන්ගේ පුත්‍රයා මිය ගිය අතර අනෙක් නිවසෙහි තිදෙනෙක් මිය ගියහ.

එවන් යුද අපරාධ නිරීක්ෂනය කිරීම වැලැක්වීම සඳහා එ.ජා. මැදිරියට හිතාමතා පහර දුන් බව ඊස්රායලය ප්‍රතික්ෂේප කලත් එය පිලිගත නොහැකි ය. සැබවින්ම නම් එවන් ප්‍රහාර ඔවුන්ගේ අතීත වාර්තාවට මනාව ගැලපෙයි. 1967 අරාබි-ඊස්රායල යුද්ධය දියත් කල ඊස්රායලය, සිව් දිනකට පසුව සිනායි අර්ධද්වීපය ආසන්නයේ දී, එක්සත් ජනපදයේ ලිබර්ටි නම් ඔත්තුසේවා නෞකාව, ප්‍රහාරක යානා හා යාත්‍රා මගින් ගිල්වා දැමුවේ නාවිකයන් 34 කට මරුකැඳවමින් හා 171 දෙනෙකුට තුවාල සිදු කරමිනි. හොඳින් ගනන් බලා එල්ල කල ප්‍රහාරයට එකම හේතුව වූයේ, ඊජිප්තුව ඊස්රායලයට පහර දුන් බවත්, එයට ප්‍රති ප්‍රහාර ලෙස තමන් අරාබි රටවල් තුනකට ගුවන් ප්‍රහාර එල්කල බවටත් කල ඊස්රායලයේ ප්‍රකාශ තරයේම බොරුකරන තොරතුරු ලිබර්ටි නෞකාව රැස් කර තිබීම යි.

1996 අප්‍රේල් මස එක්සත් ජාතීන්ගේ පරිශ්‍රයට එල්ල කල ඊස්රායල් ෂෙල් වෙඩි ප්‍රහාරවලින්, ලෙබනන් වැසියන් 100ක් මිය ගිය අතර තවත් සිය ගනනක් තුවාල ලදහ. එය අත් වැරදීමක් බවට ඊස්රායලයේ ප්‍රකාශය, එක්සත් ජාතීන්ගේ ස්වාධීන පරීක්ෂනයෙන් සොයා ගත් තොරතුරුවලට නොගැලපුනි.

රයිස් නතරව සිටි කාලය තුල මන්දගාමීව තිබූ ඊස්රායල ගුවන් ප්‍රහාර ඇය නික්ම ගිය වහාම යලි ආරම්භ විය. වැල නොකැඩී සිදු වූ ප්‍රහාරවලින් පසුව, දකුනු දිග ලෙබනනයෙන් ඝන දුමාරයක් ඉහලට නැගී ආවේ ය. අඟහරුවාදා උදෑසන, ඊස්රායලයේ දෙවැනි පෙරමුන වන ගාසා තීරුවෙහි ගුවන් ප්‍රහාර අලුතින් පටන් ගත් අතර අට දෙනෙක් තුවාල ලැබූ බව, වෛද්‍ය සේවකයන් හා ප්‍රදේශ වාසීන් පැවසූහ.

මීට පෙර දකුනු ලෙබනනයට එල්ල වන ප්‍රහාරයන්ගෙන් පන බේරාගැනීමට පලායන සරනාගතයන්ගෙන් පිරී වරාය බඳ නගරයක් වූ ටයිරේ ආසන්නයේ දී, මානුෂික නීතීන් දරුනු ලෙස උල්ලංඝනය කරමින් රතු කුරුස ගිලන් රථ දෙකකට ඊස්රායල් හෙලිකොප්ටර්වලින් රොකට් ප්‍රහාර එල්ල විය. රියදුරන් දෙදෙනෙකු ද ඇතුලු හය දෙනෙක් දරුනු ලෙස තුවාල ලදහ. පැහැදිලිව සටහන් කල රතු කැරුස ලාංඡන ද, කොඩි ද, සහිතව, නිල් එලි දල්වා ගත් ගිලන් රථ දහයකට අඩුම තරමින් පසු ගිය දෙසතිය තුල බෝම්බ හෙලූ අතර දුසිමකට වැඩි සාමාන්‍ය මගීන් සංඛ්‍යාවක් මිය ගියේ ය.

## සටන් විරාමයක් සඳහා ඉල්ලීම් ඉවත දැමුනි

ලෙබනන්හි මියගියවුන් ද, විපතට පත් ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් ද පිලිබඳව බේරූට්හි දී රයිස් කල ප්‍රකාශය - එනම්, "ඔවුන් විඳි වධ වේදනාවන්" ගැන " බෙහෙවින් කනගාටු වන" බව - ඔවුන්ට කල නිග්‍රහයක් වෙන්නේ, විපතට පත් වූවන් සඳහා සහන සැලසීමට ඩොලර් මිලියන 30ක හදිසි ආධාරයක් දෙන බවට කල ඇගේ ප්‍රකාශය යි. එය ජනතාව බිය ගැන්වීමටත්, ඔවුන්ගේ අඬු කඩා

දැමීමටත් ඊස්රායලයට සපයා ඇති ඩොලර් බිලියන ගනනාවක් වන මිසයිල හා වෙනත් යුද උපකරන සමග සසඳා බැලූකල සොච්චමකි.

බෝම්බ හෙලීම දිගටම සිදුවුව හොත් සිය ආන්ඩුව බිඳවැටේ යයි ලෙබනන් අගමැති ෆවුඩ් සිනිඕරා බිය පල කිරීමෙන් පසුව ද රයිස්, වහාම සටන් අත්හිටුවීමක් පිලිබඳව ඔහු කල ආයාචනය ඉවත දැමී ය. හෙස්බුල්ලාවරුන්ගේ හිතවතෙකු ලෙස සැලකෙන, පාර්ලිමේන්තුවේ කථානායක නාබි බෙරි කල ඉල්ලීම ද ඇය ප්‍රතික්ෂේප කලාය. ඔහු කියා සිටියේ, ගැටුම විසඳීමේ පුලුල් සැලැස්මක් සාකච්ඡාවට ගැනීමට ප්‍රථම, දකුනු ලෙබනනයෙන් පලාගියවුන්ට යලි පැමිනීමට ඊස්රායලය ඉඩ සැලසිය යුතු බවත්, සිරකරුවන් හුවමාරු කිරීමෙන් පසුව වහාම සටන් විරාමයකට එලඹිය යුතු බවත් ය.

යුද්ධය පිලිබඳව ඊස්රායලය තුල වර්ධනය වන සැක සාංකාවන් හා හෙස්බුල්ලා සටන්කරුවන් විසින් දක්වූ බලාපොරොත්තු රහිත දැඩි ප්‍රතිරෝධය ද හමුවේ, කඩිමා-කම්කරු ආන්ඩුව, ලෙබනනය තුලට කඩා වැදීම පුලුල් කල යුතු යයි ජෙරුසලමේදී රයිස් ඉල්ලා සිටියා ය.

පසු ගිය දින කිහිපය තුල, ප්‍රමුඛ ඊස්රායල් විචාරකයන් ගනනාවක් දිග් ගැස්සුනු ගොඩබිම් යුද්ධයක් පිලිබඳව බිය පල කලහ. ඔවුන් සලකන්නේ වැඩි වන ජීවිත හානි නිසා නොවැලැක්විය හැකි විරෝධයක් පැන නගිනු ඇති බවයි. *හාරෙට්ස්* පත්‍රයට ලියමින් ජුලි 23 දින ගිඩිඔන් ලෙවි අනතුරු ඇඟවූයේඃ

"යුද්ධය ව්‍යාකුලත්වයකට මුහුන පානු ඇත. ගුවන් හමුදාව නොසෑහෙන බව ප්‍රත්‍යක්ෂ වීමත් සමග, දැනටමත් ඇරඹී ඇති ගොඩබිම් ආක්‍රමනය උත්සන්න වනු ඇත. නිතර සඳහන් කෙරෙන ලෙබනන් මරාලය යලි අගැයීමට ලක්වනු ඇත. නිවාස සෝදිසියේ දී දැනට මත් දිනපතා සිදු වන ආකාරයට සොල්දාදුවන් මියයන විට විරෝධතාවන් මතු වී සමාජය භේද භින්න වනු ඇත."

රයිස් මුනගැසීමට පෙර දින, දකුනු දිග ඊස්රායලයේ සංචාරයක යෙදුනු ඕල්මට්, හෙස්බුල්ලාවරුන් තලා දමන බවට ඔහු කලින් දී තිබූ දිව්රුම හකුලා ගනිමින් කියා සිටියේ, "මා විශ්වාස කරන්නේ සාධාරන කාල පරාසයක් තුල හෙස්බුල්ලාවරුන් සැලකිය යුතු තරම් දුබල කර හුදෙකලා කරන ආදර්ශමත් විසඳුමක් ඇති කර ගැනීමට, ජාත්‍යන්තර ප්‍රතිචාරයේ හා අරාබි ලෝකයේ ඇතිව තිබෙන වෙනස්කම් මගින් අපට අවකාශ සැලසෙනු ඇති බවයි." ලෙබනනය ආක්‍රමනය කිරීමට ඊස්රායලය ඇදී නොයනු ඇතැයි ද ඕල්මට් කියා සිටියේ ය.

ජෙරුසලමෙන් නික්ම ගිය රයිස්, පලස්තීන අධිකාරියේ සභාපති මහමුඩ් අබ්බාස් හමුවීමට බටහිර ඉවුරේ නතර වූවා ය. පෙරමුනු දෙකෙහිම කරගෙන යන ඊස්රායල් ආක්‍රමනය මධ්‍යයේ ඔහු, ඊස්රායල හමුදාවන්ට කෙරෙන පලස්තීන ප්‍රහාර නතර කිරීමටත්, "සාමකාමී කාල පරිච්ඡේදයක්" පවත්වා ගැනීමටත් ප්‍රතිඥා දුන්නේ ය. පලස්තීන කන්ඩායම් ගනනාවක් ගාසා තීරුවේ හා බටහිර ඉවුරේ මහා වැඩ වර්ජනයක් කැඳවා, රයිස් හමුව වර්ජනය කරන ලෙස අබ්බාස්ට බල කලහ. එක්සත් ජනපද පරිපාලනය වෙතින් ලද කොලපැහැති සංඥාවෙන් පසුව පලස්තීනුවන්ට හා ලෙබනන් ජනතාවට එරෙහිව ජනසංහාරක යුද්ධයක් ගෙන යන බවට ඔවුහු ඊස්රායලයට චෝදනා කලහ.

එක්සත් ජනපදයේ මුදලින් ගෙන යන යුද ව්‍යායාමය සඳහා ඊස්රායල් මිලිටරියට තවත් කල් ලබා දීමේ විනිවිද පෙනෙන මැදිහත් වීමකින් පසුව රයිස්, සතියේ ඉදිරි දිනවල දී මැද පෙරදිග අර්බුදය සාකච්ඡා කෙරෙන ජාත්‍යන්තර සමුලු දෙකකට සහභාගි වීමට නියමිත ය. දකුනු ලෙබනනයෙන් හෙස්බුල්ලාවරු පලවා හැරීමෙන් පසුව එහි පොලිස්කාරකම් සඳහා "ස්ථාවරත්වය සුරැකීමේ" නේටෝවේ හෝ යුරෝපා සංගම් හා අරාබි හමුදාවක් යෙදවීමේ විවිධ යෝජනා සාකච්ඡාවට ගැනෙන රෝම රැස්වීමට ඇය ප්‍රථමයෙන් සහභාගි වෙයි. බුෂ්ගේ සමීපතමයෙක් වන බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්, ලෙබනනයේ ප්‍රචන්ඩත්ව " ව්‍යසනයක්" ලෙස හැඳින්වුවත්, ඉහත කී වර්ගයේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට පෙර සතුරුකම් පිටුදැකීමක් අවශ්‍ය බව අවධාරනය කලේ ය.

ඉන් පසුව රයිස්, බ්‍රහස්පතින්දාට හා සිකුරාදාට, කුවාලා ලම්පූර්හි පැවැත්වීමට නියමිත ආසියානු කලාපීය සමුලුවට, චීනය, රුසියාව, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව හා ජපානය මෙන් ම යුරෝපීය සංගමය සමග සහභාගි වෙයි. ලන්ඩන්හි පලවන *ටයිම්ස්* පත්‍රයට අනුව, "බ්‍රිතාන්‍ය නිලධාරීන් කියන පරිදි දහස් ගනනක් වනු ඇති සාම හමුදාව ගොඩනැගීමට ඉහත කී සමහර රටවලින් මිනිස් බලය සපයනු ඇතැයි බටහිර දේශපාලනඥයින් පැහැදිලිව අපේක්ෂා කරති."

එවන් යටත් කිරීමේ සැලැස්මක් සඳහා දහස් ගනනක් මරා දැමීම මගින් හෙස්බුල්ලාවරුන් මිලිටරිමය වසයෙන් විනාශ කර දැමීම පමනක් සෑහෙන්නේ නැත. ඒ සඳහා රටේ පාසැල් ආරෝග්‍යශාලා, ශුභ සාධන සේවා හා ප්‍රතිනිර්මාන ව්‍යාපෘතීන් ඇතුලත් සමස්ත පොදු කාර්ය ව්‍යුහයම බිඳ විසුරුවිය යුතු ය. මෙය මැද පෙරදිග පුරා මහජන විරෝධය තව දුරටත් අවුලුවාලනු ඇති අතර පැන නැංවෙන ප්‍රචන්ඩත්වය මතින්, යුද්ධය, සිරියාව හා ඉරානය කරා පුලුල් කිරීම සඳහා යොදා ගත හැකිවේ යයි වොෂින්ටනය පැහැදිලිව ම ගනන් බලයි.

© www.wsws.org